# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**1 ශ්‍රේණිය - ගණිතය / දෙවන වාරය / ජුනි මස 3 සතිය**

සැකසුම - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

ඒ. එම්. එම්. ඩී. කුමාරි - ර/ ජේසු බිළිඳුගේ කන්‍යාරාම ජාතික පාසල

18 <u>පාඩම - රටා ගොඩනැගීම</u>

- ඔන්න දුවේ පුතේ අද අපි අලුත් වැඩක් කරන්න යන්නේ. ඔයාලා මිදුලේ තියන ගහකින් මල් 5 ක් හා කොළ 5ක් කඩාගෙන ඒ ටික විවිධ රටාවන්ට තියන්න උත්සහ කරන්න. ඒ ගමන් ම මෙන්න මේ වගේ රටාවන් හදලා හිස්තැනට එන රූපය මොකද්ද කියල හොයා ගෙන ලස්සනට ඇඳලා පාට කරන්න පුළුවන්ද බලන්න.


.............................................


.............................................


.............................................

- වටපිටාවෙ තියන මදටිය ඇට, ගල් කැට, වේළුණු කොළ, රබර් ඇට වගේ පුංචි පුංචි දේවල් ටිකක් එකතු කරල මේ වගේ රටා ටිකක් හදන්න උත්සහ කරමුද? ඔන්න එහෙම හදලා ඒවායින් 5 ක් ගණිතය අභ්‍යාස පොතේ අඳින්නත් ඕනි.
- ඊළගට අපි තවත් විනෝදජනක වැඩක් කරමු. ඔයාලා ගෙදර වැඩිහිටියෙක් එක්ක එකතු වෙලා පාට කඩදාසි කොළ අරන් පාට පාට හැඩතල හා මල් කපාගෙන ලස්සන රටා කීපයක් සුදු A4 කොළයක අලවන්න.
- ඔයාලා අලවපු රටා අතර මේ වගේ ඒවත් තියනවද බලන්න. මේ තියන රටාවල හිස්තැනට එන රූපය අඳින්න. දැන් කැමති පාටකින් රටාව පාට කරන්න.


.............................................


.............................................


.............................................

- ඔයා කැමති පාට දෙකක් අරගෙන මේ හැඩතල රටාවක් එන සේ පාට කරන්න



වැඩ ඔක්කොම ඉවරයි නම් මෙන්න මේ තරුව පාට කරගන්න. 